# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
## පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් 2017.08.14. දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>තනතුරු සහ වැටුප් පරිමානය</u>**

1. ව්‍යාපෘති කළමනාකරු (ස්ථිර/කොන්ත්‍රාත්/වැඩ පැවරුම)
   රු. 46,131 – 8× 883; 8×1082- 61,851 (මාසික) [U-EX 2 (II) -2016]

   සටහන : රජයේ හෝ පෞද්ගලික අංශයෙන් විශ්‍රාම ලැබූ හෝ සේවයෙන් තාවකාලිකව නිදහස් කරනු ලබන නිලධාරීන් වැඩ පැවරුම හෝ කොන්ත්‍රාත් පදනම මත පත් කිරීමට සලකා බලනු ලැබේ.

2. වෛද්‍ය නිලධාරී (ස්ථිර/කොන්ත්‍රාත්)

   රු. 38,768 – 10×883; 1×1,082 – 48,680 (මාසික). [U-MO 1(II)-2016]

3. ප්‍රධාන විනයාරක්ෂක නිලධාරි

   රු 46,131 – 8x 883; 8x 1082- 61,851 (මාසික) [U-EX 2 (II) -2016]

4. ප්‍රධාන ආරක්ෂක නිළධාරී II ශ්‍රේණිය

   රු. 35,556 – 3x 801 – 37,959(EB )- 38,842 -12×883 -49,438 (මාසික) [U-EX 1 (II) -2016]

5. විනයාරක්ෂක නිලධාරි II ශ්‍රේණිය

   රු. 26,592 -18 x 335 – 32,622 (මාසික) [U-MN 2 (II) -2016]

6. මහජන සෞඛ්‍ය පරික්ෂක IIIශ්‍රේණිය

   රු. 22,571 - 7x213;10x253 - 26,592 (මාසික) [U-MT 1(III) -2016]

   සටහන : රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ නිලධාරීන් වැඩ පැවරුම හෝ කොන්ත්‍රාත් පදනම මත පත් කිරීමට සලකා බලනු ලැබේ.

*සටහන : ඉහත වැටුප් පරිමානයන් 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 පරිදි සංශෝධනයට ලක් වනු ඇත.*

**<u>ප්‍රතිලාභ:</u>**

පත්වීම්ලාභීන් ජීවන වියදම් දීමනාව ඇතුළුව රජයේ අනුමත දීමනා ලැබීමට හිමිකම් ලබයි.

වෛද්‍ය නිලධාරී ලෙස පත්වීම් ලබන්නන් ‘සමාන කිරීමේ දීමනාව’ සඳහා හිමිකම් ලබයි. (බාධක, පොරොත්තු හා ප්‍රවාහන යන දීමනා ඇතුලත් )

පත්වීම්ලාභීන් තම මාසික වැටුපෙන් 10% ප්‍රමාණයක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක වේ. විශ්වවිද්‍යාලය විසින් සේවකයාගේ වැටුපෙන් 8% සමාන ප්‍රමාණයක් විශ්‍රාම වැටුප් අරමුදලටද, 7%

ප්‍රමාණයක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලටද, 3% ප්‍රමාණයක් සේවක භාරකාර අරමුදලට ද බැර කරනු ඇත.

**<u>අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය</u>**

නිර්දේශිත අයදුම්පත්‍රය හා බඳවා ගැනීමේ පටිපාටිය පිළිබඳ තොරතුරු www.sab.ac.lk විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය මගින් බා ගත කර ගැනීම හෝ නියෝජ්‍ය ලේඛකාධිකාරී (ආධ්‍යයන ආයතන) ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය ලිපිනයට 9''x4'' ප්‍රමාණයේ, ස්වකීය නම හා ලිපිනය ලියන ලද මුද්දර කවරයක් 2017.08.04 දිනට පෙර එවීමෙන් ලබා ගත හැක.

රාජ්‍ය /සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල වල අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ කරන ලද නිර්දේශත අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික පිටපත් සමඟ අදාල ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවර තමන් අයදුම් කරන තනතුර සඳහන් කර 2017.08.14 දිනට පෙර නියෝජ්‍ය ලේඛකාධිකාරී (ආධ්‍යයන ආයතන) ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ.පෙ. 02, බෙලිහුල්ඔය ලිපිනයට ලැබෙන ලෙස යොමු කළ යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් කර නැති හෝ අපැහැදිළි හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අනෙකුත් නියමිත අවශ්‍යතාවයන් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් ගැන නැවත සලකා බලනු නොලැබේ.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
2017.07.20